# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 33 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 සැප්තැම්බර් මස 26 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 සැප්තැම්බර් මස 26 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

**මිල : රු. 7.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2008 අංක 33 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන්කලේ 2008 සැප්තැම්බර් මස 26 වන දින]

එල්. ඩී.— ඕ. 30/2008

**2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2008 අංක 33 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනතේ දීර්ඝ නාමයේ ඇති "ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියා සැලසුමක් පිළියෙල කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා වූ කාර්ය බලකායක් පත්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම භාරව සිටින ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද" යන වචන වෙනුවට "තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ඒ සඳහා අනුමතය ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ක්‍රමෝපාය සහ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා බලය සහිත ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් එහි දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "1 (1) මේ පනත" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1. මේ පනත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

2—PL 003211 -3,550 (2008/09)

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ පැති සටහන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය"

2 වන වගන්තියට පෙරාතුවම ඇති ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට පෙරාතුවම වූ ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ:—

"තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ අනුමත කිරීම"

ප්‍රධාන ප්‍රඥප්තියේ 3, 4 සහ 5 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3, 4 සහ 5 වන වගන්ති මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:—

"අන්තර් අමාත්‍යාංශ කමිටු.

3. (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන අන්තර් අමාත්‍ය කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ආ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන හෝ අධ්‍යාපන හෝ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නාමිකයෙක් හෝ නාමිකයන්;

(ඈ) ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා සහ සභාපතිවරයා විසින් නම් කරනු ලබන වෙනත් එක් සාමාජිකයකු; සහ

(ඉ) රාජ්‍ය පරිපාලන සහ විදුලි සංදේශ සහ වෙනත් පරදු දරන්නන් ප්‍රභේද යන ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන කැබිනට් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන තැනැත්තන් සංඛ්‍යාවක්.

කමිටුවේ බලතල ආදිය.

4. (1) 2 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳව රජයට උපදෙස් ලබාදීම කමිටුවට භාර කාර්යය වන්නේ ය.

(2) කමිටුව වසරකට එක්වරක් හෝ රැස්විය යුතු ය.

(3) කමිටුවේ රැස්වීම්වලදී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය නියම කරනු ලැබිය යුතු ය.

කමිටුවේ කර්තව්‍ය.

5. 4 වන වගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව,—

(අ) 2 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා, ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ නිර්දේශ මත ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම;

(ආ) ජාතික ප්‍රතිපත්ති සැලැස්ම කාලානුරූපී ලෙස සමාලෝචනය කිරීම සහ එකී සැලැස්මට අවශ්‍ය විය හැකි යම් වෙනස්කම් සිදුකිරීම සඳහා කැබිනට් අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීම;

(ඇ) කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ආකාරයට, ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම වැඩසටහන් සහ ක්‍රමෝපාය

ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතන සහ පරදු දරන්නන්ට කලින් කල විධාන නිකුත් කිරීම;

(ඈ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහ සේවා ක්ෂේත්‍රයට අදාල මානව සම්පත් සංවර්ධනය සහ වෙළෙඳපල නිර්මාණය සඳහා උචිත ප්‍රමිතීන් හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ අදාල කර ගැනීමට සැලැස්වීම සහ හොඳම ප්‍රායෝගික ක්‍රම නිර්දේශ කිරීම;

(ඉ) අන්තර් ක්‍රියාකාරී තොරතුරු තාක්ෂණ ක්‍රම සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම සහ ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික අංශය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීම;

(ඊ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ සියලු අංශවල පර්යේෂණ වැඩි දියුණු කිරීම සහ පැවැත්වීම;

(උ) කමිටුවේ කර්තව්‍ය ඉටුකිරීම සහ ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා සහ අවශ්‍ය වෙනත් දේ සිදු කිරීම;

(ඌ) පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී නියෝග සෑදීම සඳහා නිර්දේශ කිරීම;

කමිටුවේ කර්තව්‍ය විය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියෙහි "කාර්ය බලකායට සහ කමිටුවට සහාය ලබා දෙන විධායක නියෝජිත ආයතනය විය යුතු ය" යන වචන වෙනුවට "කමිටුවට සහාය ලබා දෙන නියෝජිත ආයතනය විය යුතු අතර, එම ආයතනය විසින් තොරතරු සන්නිවේදනය පිළිබඳ ක්‍රමෝපාය සහ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. කමිටුව විසින් ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම

සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහාය නියෝජිත ආයතන විසින් සපයනු ලැබිය යුතු අතර, එකී කමිටුවට ලේකම් කාර්යාලයක් ලෙස ද එම නියෝජිත ආයතනය ක්‍රියාත්මක විය යුතු ය ;" සහ

(2) එම වගන්තියේ දෙවන උපවගන්තියේ—

(i) එහි (ආ), (ඇ), (ඈ) සහ (උ) ඡේද වල සඳහන් "ක්‍රියා සැලසුම" යන වචන ඉවත් කිරීමෙන් ; සහ

(ii) එහි (ඊ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(ඊ) ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා සංශෝධනය කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුතු කරුණු කාරණා හඳුනා ගැනීම;"; සහ

(iii) එහි (ඌ) ඡේදය ඉවත් කිරීමෙන්.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කරනු ලැබේ:—

"(1) පරදු දරන්නන් විමසීමෙන් සහ කමිටුව විසින් ගනු ලබන තීරණ වලින් අනතුරුව, අමාත්‍යවරයා විසින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ කාරණා පිළිබඳව එකී නියෝජිත ආයතනයට සහ වෙනත් රාජ්‍ය ආස්ථිතයයන් වෙත විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකිය.".

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය (2) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්; සහ

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "කාර්ය බලකාය" යන වචන ඉවත් කිරීමෙන්.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.